# ජවිපෙ දෝලනය රටට අහිතකරය

එක්සත් ජාතික පක්ෂයේ යම් පිරිසක් ආණ්ඩුවට සහාය දීම මුළු පක්ෂය ම සහාය දීමට වඩා රටට හිතකර ය. ඒ පිරිස අතර වුව ද ජාතිකත්වයක් නැති පුද්ගලයන් යම් ප්‍රමාණයක් හෝ සිටීම ජාතික බලවේගවලට තර්ජනයක් වෙයි. ෑස්නානායක යුගයේ දී නම් එ ජා පක්ෂයට යම් ජාතිකත්වයක් තිබූ බව පැහැදිළි ය. ශ්‍රී ල නි පක්ෂය බිහිවීමට පෙර මෙරට ජාතිකත්වයක් අගය කළ බොහෝ දෙනා ඡන්දය දුන්නේ එ ජා පක්ෂයට ය. එසේත් නැත්නම් එ ජා ප පිහිටුවීමට පෙර සේනානායකවරුන්ගේ සහභාගීත්වයෙන් තිබූ සංවිධානවලට ය. ලංකා සමසමාජ පක්ෂයට හා පසුව පිහිටුවනු ලැබූ කොමියුනිස්ට් පක්ෂවලට ජාතිකත්වයක් තිබූ සුළු කොටසක් වුව ඇදීගියේ එහි ඊනියා කම්කරු පංති නායකත්වය ගැන තිබූ විශ්වාසයක් නිසා හෝ ඊනියා දයලෙක්තියක් නිසා හෝ නොව, එහි තිබූ අධිරාජ්‍ය විරෝධී ගුණය නිසා ය. අධිරාජ්‍ය විරෝධය ඇතැමුනට පෙනී ගියේ ජාතික නිදහස් සටනේ ප්‍රධාන අංගය ලෙස ය. එහෙත් ඔවුනට ඒ පක්ෂවල තිබූ සංස්කෘතික යටත්විජිතවාදය තේරුම්ගැනීමට නො හැකි විය. ඊනියා වාමාංශික පක්ෂවල අධිරාජ්‍ය විරෝධය හුදු ධනපති විරෝධයක අංගයක් පමණක් විය. කම්කරු පංති සංස්කෘතිය යනු බටහිර යුදෙව් ක්‍රිස්තියානි සංස්කෘතියෙන් ගලා එන්නක් පමණක් විය. ශ්‍රී ල නි පක්ෂය පිහිටුවන තෙක් මෙරට ජාතිකත්වයක් ගැන සැලකූ පිරිසෙන් බහුතරය එ ජා පක්ෂයට ඡන්දය දීම පුදුමයක් නො වෙයි. එහෙත් ජයවර්ධන යුගයත් සමග එ ජා පක්ෂයේ ජාතිකත්වය නැතිවිණි. අප නොයෙකුත් අවස්ථාවල කියා ඇති පරිදි ශ්‍රී ල නි පක්ෂය ආරම්භයේ දී තවත් ලිබරල් පක්ෂයක් පමණක් විය. ඒ රූපාන්තරකරණයකින් ජාතිකත්වයේ පක්ෂය බවට පත්වූයේ පනස්හතරෙන් පසුව ය. එය කරන ලද්දේ පක්ෂයෙන් පිටත සිටි කොටසක් විසින් වීම මෙහි ඇති වැදගත්කම ය. ශ්‍රී ල නි පක්ෂය යනු එයට හිතවත් ඡන්ද පදනමේ බලපෑම්වලට ඇහුම්කන් දෙන පක්ෂයකි. බන්ඩාරණායක මහතා තමන් වෙල්වනායගම් මහතා සමග ඇතිකරගත් ගිවිසුම ඉරා දැම්මේ එවැනි ඇහුම්කන්දීමකින් පසුව ය. ශ්‍රී ල නි පක්ෂය පිහිටුවීමෙන් පසුව මෙරට තවදුරටත් ඊනියා වාමාංශික පක්ෂවලට තැනක් නැතිවිය. ශ්‍රී ල නි පක්ෂය, එ ජා පක්ෂය මෙන් නොව අධිරාජ්‍ය විරෝධී ද විය. ශ්‍රී ල නි පක්ෂය පිහිටුවා ඒ ජාතික පක්ෂයක් වීමෙන් පසුව අධිරාජ්‍ය විරෝධය වාමාංශිකයන්ගේ තනි උරුමයක් නො වී ය. මාක්ස්වාදී වාමාංශික පක්ෂවලට 1956න් පසුව ශ්‍රී ල නි පක්ෂය සමග විවිධ සන්ධාන ඇතිකරගැනීම හැරෙන්නට වෙනත් විකල්පයක් නො වී ය. වෙනත් විප්ලවීය විකල්ප සොයාගිය විවිධ මාක්ස්වාදී වාමාංශික කණ්ඩායම් අද වන විට නාම පුවරු (ත්‍රීරෝද) පක්ෂ බවට පත්ව තිබීමෙන් මේ කරුණ ප්‍රායෝගිකව ම සනාථ කෙරී ඇත. ශ්‍රී ල නි පක්ෂය සමග සන්ධානවලට ගිය පක්ෂවලට ද අත්වූයේ ක්‍රම ක්‍රමයෙන් අභාවයට යෑමේ ඉරණම පමණ ය.

මේ සාධාරණීකරණයට පිටින් ගිය වාමාංශික මාක්ස්වාදී පක්ෂය වූයේ ජ වි පෙරමුණ ය. එය බිහිවූයේ මාඕවාදී තිඹිරිගෙයිනි. මාඕවාදයේ යම් ආකාරයක ජාතිකත්වයක් තිබුණි. ලෙනින්ගේ පක්ෂයේ ද රුසියන් ජාතිකත්වයක් වූ බව ඇතැම් යුරෝපීය පඬුවන් පවසා ඇත. එහෙත් ලෙනින් ස්ටැලින්වාදයේ ඒ කියන ජාතිකත්වයක් නොතිබූ බව අද ඒ රටවල් ඒ වාදවලට විරුද්ධව යෑමෙන් පෙන්නුම් කෙරෙයි. මාක්ස් ට්‍රොට්ස්කිවාදය ගැන කිවයුතු නොවන්නේ ඒ තනිකර ම ජාතිකත්වයෙන් පිට සිටි බැවිනි. මාඕවාදයේ වුව ද වර්ධනය වූ ජාතිකත්වයක් නො තිබුණි. කෙසේ වෙතත් ජ වි පෙරමුණ බිහිවූයේ මාඕවාදී ගුරුකුලයෙන් ය. ආරම්භයේ සිට ම ජ වි පෙ මාඕවාදය (මාක්ස්වාදය) හා ජාතිකත්වය අතර දෝලනය විණි. මෙරට දෙමළ ප්‍රශ්නය පිළිබඳ ව විජේවීර මහතා විවිධ කාලවල ලියා ඇති ලිපි ලේඛනවලින් පෙන්නුම් කෙරෙන්නේ මේ දෝලනය ය. එසේ ම ජ වි පෙරමුණ ශ්‍රී ල නි පක්ෂය පිළිබඳ ඇතිකරගන්නා ආකල්පවල ද මේ දෙබිඩි ස්වභාබවය වෙයි. පැරණි වාමාංශික පක්ෂවලට ශ්‍රී ල නි පක්ෂය යනු වැඩිම වුවහොත් ජාතික ධනේශ්වරයේ පක්ෂය විය. කිසි දිනෙක වලංගු නොවූ පංති අරගලයක් මත සමාජය දෙස බලන මේ අබල දුබල පිරිහුණු වාමාංශික පක්ෂ ශ්‍රී ල නි පක්ෂය සමග සන්ධානවලට ගියේත් ත්‍රිරෝද පක්ෂ නොගියේත් මූලික වශයෙන් ම ශ්‍රී ල නි පක්ෂය පිළිබඳ ඇතිකරගත් මේ දැනුම මත පදනම් වෙමිනි. ජාතිකත්වයක් නැති ඊනියා වාමාංශික පක්ෂවලට අත් වූ ඉරණම ජ වි පෙරමුණ මුල සිටම නොදැන සිටියා නො වේ. එහෙත් ජ වි පෙරමුණට ශ්‍රී ල නි පක්ෂය පිළිබඳ තමන්ගේ ම වූ මතයක් නො වී ය. මාක්ස්වාදය හා ජාතිකත්වය අතර දෝලනයවන පක්ෂයකට ශ්‍රී ල නි පක්ෂය පිළිබඳ පැහැදිළි මතයක් ඇතිකරගැනීම උගහට ය. වරෙක ශ්‍රී ල නි පක්ෂය වෙත ඇදී යන ජ වි පෙ විටෙක ඉන් විකර්ෂණය වෙයි. පසුගිය දා නන්දන ගුණතිලක මහතා කර ඇති ප්‍රකාශයකට අනුව 1988 - 89 කාලයේ දී ශ්‍රී ල නි පක්ෂය ප්‍රධාන කොට බිහිවූ ප්‍රජාතන්ත්‍රවාදී මහජන සන්ධානයට එක්වීමට විජේවීර මහතා කැමැත්ත පළකර තිබුණි. එහෙත් ජ වි පෙරමුණේ මධ්‍යම කාරක සභාව එයට විරුද්ධ වී ඇත. එසේ විරුද්ධ නොවී නම් විජේවිර මහතා අද ද ජීවතුන්

© Prof. Nalin De Silva

අතර සිටීමට තිබිණි යැයි ගුණතිලක මහතා කියයි. එදා ඒ සාකච්ඡාවලට ජ වි පෙ අනුග්‍රහයෙන් අද ජාතික හෙළ උරුමයේ නායකයකු ද සහභාගි වූ නමුත් ඒ පිළිබඳ ව හෙළ උරුමය මෙන් ම ජ වි පෙ ද නිහඬ ය. ඒ කෙසේ වෙතත් නන්දන ගුණතිලක මහතා තවදුරටත් කියා සිටින්නේ අද ආණ්ඩුව සමග එකතුවීමට සෝමවංශ අමරසිංහ මහතා එකඟ නමුත් ජ වි පෙ මධ්‍යම කාරක සභාව එයට විරුද්ධ බව ය. එය සත්‍යයක් විය යුතු ය. අද ජ වි පෙරමුණ තුළ ටිල්වින් සිල්වා මහතා ශක්තිමතා බවට පත්වී ඇත. එහෙත් ඒ මහතා පසුගිය දා ක්වොන්ටම් භෞතිකය හා ඊනියා දයලෙක්තිය ගැන වූ පොතක් එළි දැක්වීමේ උත්සවයක දී ස්වභාවයේ දයලෙක්තිය නමැති පොත ලියා ඇත්තේ කාල් මාක්ස් යැයි පවසා ඇත. මාක්ස් පොත්පත් රාශියක් ලියා ඇති මුත් ඔය කියන පොත නම් ලියා ඇත්තේ එංගල්ස් ය. අද ඉරිදා දිවයින හැරෙන්නට වෙනත් පුවත්පත් අල්ලාගෙන විවිධ පඬියෝ විවිධ දේ කියති. ඒ සියල්ලට පිළිතුරු දිය හැකි වුවත් ඔවුන්ගේ මැටි මෝල්කම් නම් අපට නැතිකළ නො හැකි ය. ක්වොන්ටම් භෞතිකය ගැන කලින් කියන ලද පොතෙහි ඇති කොටසක් මගෙන් ක්වොන්ටම් භෞතිකය ඉගෙනගන්නා ශිෂ්‍යයන්ට කියවූ විට ඔවුහු සිනහසීමට පටන්ගත්හ. සරල විනෝදය සඳහා නම් මෙවැනි පොත් නිර්දේශකළ හැකි ය. හේතුවාදය වෙනුවෙන් ආණ්ඩුවේ පත්තරයකට ලියන තවත් මැටි පිඩක් පොල් වැටීමට හේතුව පහදා දෙයි. ඔහු ඒ වෙනුවෙන් නව ප්‍රවාදයක් ගොඩනගා ඇත! මේ මැටි පිඬ උසස් පෙළ ළමුන් ද දන්නා ආවේගය හා බලය අතර වෙනසවත් නො දනියි. මොහු ක්වොන්ටම් භෞතිකයේ ඉලෙක්ට්‍රෝනයක් එක් කක්ෂිකාවක සිට තවත් කක්ෂිකාවකට (ඔහු යොදාගන්නේ කක්ෂ යන වචනය ය. ක්වොන්ටම් භෞතිකයෙහි කක්ෂ නැත.) පැනීමට හේතුව ලෙස දකින්නේ ඉලෙක්ට්‍රෝනයෙන් ශක්ති පුංජයක් නිකුත්කිරීම ය. මොහු හේතුව යන්නෙන් අදහස්කරන්නේ කුමක් ද යන්නවත් නොදන්නා බව පැහැදිලි ය. ශක්ති පුංජය නිකුත්වීම හා ඉලෙක්ට්‍රෝනය කක්ෂිකාවක සිට (පහත) කක්ෂිකාවකට පැනීම අතර හේතුඵල සම්බන්ධයක් නැත. හැකි නම් ඒ දෙකට ම හේතුව කුමක් දැයි පවසන්න. එයටත් පළමුව හේතුවාදය යනු කුමක්දැයි මේ කසිකබල් හේතුවාදීන් කියන්නේ නම් මැනවි. වෙනත් කසිකබල් පත්තරවල පාළුගෙයි මැටි වළං බිඳින මැටි පිඩවල් ඉරිදා දිවයිනට කැඳවීමට කටයුතුකිරීමෙන් ප්‍රධාන සංස්කාරක තුමාට නැවත වරක් පත්තරයෙහි සංවාද ඇතිකිරීමට හැකිවනු ඇත.

ජ වි පෙරමුණේ නායකත්ව අර්බුදයක් ඇති බව පැහැදිලි ය. ඒ පක්ෂය සෘජුව ම ජාතිකත්වය හා මාක්ස්වාදය මත නොවුණ ද ආණ්ඩුවට එකතුවීම හා නොවීම මත දෙපිළකට බෙදී ඇත. අද ආණ්ඩුවට එකතුවිය යුතු යැයි කියන අය ඒ සඳහා කටයුතු කළ යුතු ය. ජ වි පෙ ශක්තිය ඇත්තේ වෘත්තීය සමිතිවල හෝ ශිෂ්‍ය සංගම්වල නොව ශ්‍රී ල නි පක්ෂයෙහි ය. ශ්‍රී ල නි පක්ෂයෙන් පිටත ජ වි පෙට බලයක් නැත. ඒ පක්ෂ දෙකෙහි ම පනස්හයේ දරුවෝ වෙති. එහෙත් ජ වි පෙහි බලය ඇත්තේ බොරු මාක්ස්වාදී කණ්ඩායමකට ය. ටිල්වින් සිල්වා මහතා ඒ කණ්ඩායමේ ප්‍රධානියා ලෙස අද පෙනී සිටිය ද සැබෑ බලවතුන් ටික කලකින් හෙළිදරවු වනු ඇත. අද කළ යුත්තේ සන්ධානයෙහි ජාතිකත්ව පිළ ශක්තිමත්කිරීම ය. ජ වි පෙ ආණ්ඩුවට ඉල්ලීම් විස්සක් ඉදිරිපත්කිරීමෙන් කෙළේ නොකෙරෙන වෙදකමට කෝඳුරු තෙල් හත්පට්ටයක් සෙවීමකි. ඊනියා සටන් විරාම ගිවිසුම බල රහිත වී තිබුණි. නෝර්වේ නියෝජිතයන්ට යන එන මං නැතිව තිබුණි. කොටි පසුබසිමින් සිටියහ. එහෙත් ජ වි පෙ ආණ්ඩුවෙන් පිටවීමට කටයුතු කෙළේ ය. ඒ අතර එ ජා ප එයට රිංගීමට උත්සාහයක් ගත්තේ ය. එ ජා පක්ෂයෙහි ජාතිකත්ව අදහස් දරණ කොටස් ආණ්ඩුවට එකතුවීමේ වරදක් නැත. එහෙත් රනිල් වික්‍රමසිංහ වැන්නන් එකතුවුවහොත් වන්නේ විජාතික බලවේග ශක්තිමත් වීම ය. විජාතික බලවේග යම් සැලැස්මකට අනුව වැඩකරන බව පැහැදිලි ය. ජ වි පෙ ආණ්ඩුවෙන් යන අතර එ ජා ප ආණ්ඩුවට එකතුවීමට උත්සාහ ගත්තේ ය. ඒ අතර පසුබසිමින් සිටි කොටි මුහමලේ දැඩි ප්‍රහාරයක් ඇරඹූහ. කොටි වෙනුවෙන් සටන්කරන්නේ කොටි පමණ ද? ජ වි පෙ අඩු තරමින් ආණ්ඩුව සමග එකතු විය යුතු යැයි කියන පාක්ෂිකයන් මේ සියල්ල නිරීක්ෂණය කරන බවට සැකයක් නැත. එහෙත් ඒ සම්බන්ධයෙන් ඔවුන් ගන්නා ක්‍රියා මාර්ගය කුමක් ද? අද ඇතැම් විට සියළු පක්ෂ කැඩී ජාතික හා විජාතික ලෙස පමණක් කොටස් එකතුවීමට ඉඩකඩක් වෙයි. සාම්ප්‍රදායික මාක්ස්වාදී පක්ෂ ශ්‍රී ල නි ප සමග එකතු වුවත් නැතත් ඒ පක්ෂ දියවී යෑමට නියත ය. එහෙත් මාක්ස්වාදය හා ජාතිකත්වය අතර සරල ව හෝ අනුවර්තීව හෝ නොවුණ ද දෝලනයවන ජ වි පෙ දියවන්නේ සංධානයෙන් ඉවත් වුවහොත් ය. ජ වි පෙ කසිකබල් මාක්ස්වාදයෙන් කැඩී ජාතිකත්වය මත ශ්‍රී ල නි ප සමග එකතුවන්නේ නම් රට පරිහාණියට යෑම වැළැක්විය හැකි ය. එසේ නැත්නම් පක්ෂ දෙක ද රට ද ජාතිකත්වය ද විනාශ මුඛයට යනු ඇත. මහින්ද චින්තන ආරක්ෂා වී ජනාධිපතිතුමා ද රට ද ජාතිය ද සමය ද, ආරක්ෂාවනු ඇත්තේ විජාතික බලවේග පන්නා දමන ජාතික බලවේග එකතුවීමෙන් පමණකි. ජ වි පෙරමුණ දෝලනයෙන් ඉවත් වී ජාතිකත්වයේ මග ගත යුතු ය.

**මහාචාර්ය නලින් ද සිල්වා**

© Prof. Nalin De Silva